
ඒක මහා පුදුමාකාර සිද්ධියක්......
රටේ පහත්බිම් ජනතාවට ගංවතුරෙන් බැට වදිද්දී......
රටේ තව කොටසක ජනතාවට සුළඟින් පහර වදිද්දී......
ඒ දුක කඳුළක් නොවුන අගනුවර මිනිසුන්ටත් තියෙන දේවල් දාලා දුවන්න සිද්ධ වුනා......
කොහොමද දුවන්නද , කොහේ දුවන්නද , හිතාගන්න බැහැ......
ඒකා පිට ඒකා වැටෙද්දිත් දුවනවා ඇහැරෙන්න......
දැනගෙන දුවන අයට වඩා නොදැන දුවන අය වැඩියි......
[illegible] මිනිසුන්ගේ බිය වැඩි වන්නේ එතැනදියි......
ජාති භේද...... ආගම් භේද...... ඇති නැති භේද......
ඒ කිසි දේක වටිනාකමක් ඉතුරුවුණේ නෑ......
ධන කුවේරයනුත් දුවනවා......
ඔවුන්ගේ දුප්පත් සේවකයනුත් දුවනවා......
ඒක ගොඩේ දුවනවා......
ඒකට ගෑවී ගෑවී දුවනවා......
දොස්තරත් දුවනවා...... රෝගියොත් දුවනවා......
හොරුත් දුවනවා...... පොලිස්කාරයොත් දුවනවා......
අත්වල තිබුන සියලු දේ බිම දාලා දුවනවා......
සල්ලි අහුලගන්න පාරට බැහැපු අය සල්ලි දාලා දුවනවා......
කා ගැනවත් හිතන්න...... කාටවත් උදව්කරන්න...... වෙලාවක් නෙමෙයි මේක......
හැමෝම එකම පැත්තකට දුවනවා......
ජීවිතේ බේරගන්න දුවනවා......
වැටෙනවා , නැගිටිනවා , ආයෙත් දුවනවා......
නොනැවතී දුවනවා...... අඬ අඬා දුවනවා......
පුලුවන්තරම් හයියෙන් දුවනවා......
බැරිතැනත් වීරියෙන් හයියෙන් දුවනවා......
ඒ ඇයි?


හපොයි දෙයියනේ...
අනේ... දෙයියනේ !!!
ගෝඩ් !!!
අල්ලා...
අයියෝ...
යකෝ...
අයියෝ... කන්ද සාමී...!
කතරගම දෙවියනේ...!
අනේ... කාලි මෑණියනේ !!!
බුදු අම්මෝ !!!
ඔයාත් යන්න බෑ ! වැලි කොට්ටෙට දාලා පාර වහලා !
දැන් කොහෙටද දුවන්නේ ???
මුහුදට දුවමු ! මුහුදට ! මුහුදට !
මේ දිවිල්ල
තව කොච්චර කියලා දුවන්නද ?
කොහොම දිවුවත්, කොහාට දිවුවත්
හිතට මදි..! හැම තැනම එකම හඬ... මර හඬ... විලාප හඬ...
යාඥා හඬ..! හැම භාෂාවකින්ම කියවුනේ එකම බිය ගැන...
මරණ බිය ගැන... ! හැම ආගමකින්ම, හැම දෙයියන්ගෙන්ම ඉල්ලුවේ
එකම දෙය... තම ජීවිතය ආරක්ෂා කර දෙන ලෙසට කරන බැගෑපත් ඉල්ලීම... කන්නලව්ව..!
ආගම මොන වුනත් , ජාතිය මොන වුනත්... ඉල්ලීම එක වෙලා..!
හැමෝම එක තැනකට ඇවිල්ලා...
අයියෝ... මං ආවේ අනුරාධපුරෙන් යාලුවොත් එක්ක මැච් එක බලන්න ! කට්ටියම කොහේ විසිවුනාද දන්නෑ දෙයියනේ... මං අනාථයි...
මාත් ආවේ මැච් එක බලන්න මාතර ඉඳන් ! මගෙ බෝයි ෆ්‍රෙන්ඩ් එක්ක ! අනේ දෙයියනේ... එයා කොහෙද ? අනේ අයියෝ දෙයියනේ... මේ මොකද අපිට වුනේ ?
මං කැන්ඩි ! මෙච්චර දුරක තියෙද්දී මම්මිවත් බලන්න ආවට මට හොඳ වැඩේ ! තමුසෙලාටත් හොඳ වැඩේ ! අයියෝ... ගෝඩ් මාවත් බේරලා දෙන්න !
එපා ! එපා ! මේකට නගින්න එපා !! ඩ්‍රයිවර්ට සිහිනැති වෙලා ! [illegible] වෙන එකකට නගිනවා !
ඔතනින් බහිනවා බයි !!! නැත්නං අපිට යන්න අයින් වෙනවා !!!
එළියට යන්න බැහැ !! සෙකියුරිටි එකෙන් ගේට්ටු ඔක්කොම වහලා !!!
එපා ! එපා ! පාරට පනින්න එපා !!
හපොයි දෙයියනේ... පොඩි පුතා ඉස්කෝලෙ ඇරිලා ගෙදර ගියාද දන්නෙ නෑ !? මං මළොත් එයාලට මොන කලක් යයිද ?
හපොයි... බේරාගන්න [illegible], මිනී වසිල්ලා එකට ඇඳුන් යට ! අර අම්මට ප්‍රෙෂර් වැඩිවෙලා ! කව්රුවත් නෑ !
අනේ... අනේ මගෙ දුවේ... මට ඔයා ගාවට එන්න බෑ දුවේ !? අයියෝ... මං දැන් මොකද කරන්නේ ???
ෂෝ එක නවත්තලා දැන් පැනල ගිහිල්ලා !!! රවී... ඔයා කොහෙද රවී ? අයියෝ... අයියෝ මට බයයි !
ඕ... මයි ගෝඩ්...!!!
පාරේ වාහන නෑ ! අතෑරලා දාලා ගිය ඒවා විතරයි !
අප්පා [illegible] මිනිසෙක් පේන්නෑ ඔක්කොම හැංගිලා !

රටක් සසල කළ කතාවක්....